<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>

<u>ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>

අංක 1971/17 හා 2016.06.15 , අංක 2032/33 හා 2017.08.17 , අංක 2146/22 හා 2019.10.22 , අංක 2162/10 හා 2020.02.10 සහ අංක 2165/14 හා 2020.03.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයන්ගෙන් සංශෝධිත, අංක 1880/26 දරන 2014.09.19 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3 වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10.3.1 වගන්තිය අනුව සපුරාලිය යුතු සුදුසුකම් හා කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇති පරිදි විශේෂ ශ්‍රේණියේ තනතුරු පිළිබඳ විස්තර පහත සඳහන් කර ඇත. ඒ අනුව සුදුසුකම් ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට මෙයින් කටයුතු කරනු ලැබේ.

2.1 **විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්:-**

i. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම. ***(ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉමෙන් උසස්වීම සඳහා අදාල කරගත් පශ්චාත් උපාධියක්, මෙම උසස්වීම සඳහා අදාල කරගත නොහැක)***

ii. උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහ (05) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහ (05) ක් උපයාගෙන තිබීම.

iii. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට, සුදුසුකම් ලබන ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ වසර දහ අටකට (18) නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.

v. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම හා විනයානුකූල දඬුවමකට ලක් නොවී තිබීම.

vi අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම. (රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක PSC/EST/02-03/04/2020 හා 2020.11.03 දිනැති ලිපියෙන් 2022.12.31 දක්වා සහන කාලයක් ලබා දී ඇත.)

vi. අයදුම්කරුවෙකු විසින් ඔහු හෝ ඇය ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන තනතුර අයත් ධාරාව යටතේ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවයේ තනතුරකට පත් කරනු ලැබ තිබිය යුතුය. පුරප්පාඩුව පවතින තනතුරු හා එම තනතුරු අයත් වන ධාරාවන් පහත සඳහන් කර ඇත.

| අනු අංකය | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කර ඇති පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අදාළ වන තනතුරු නාම | අයත් ධාරාව | පුරප්පාඩු වූ දිනය |
|---|---|---|---|
| 1 | අතිරේක ලේකම්,<br>වී හා ධාන්‍ය ,කාබනික ආහාර ,එළවළු, පලතුරු, මිරිස්, ලූනු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය, බීජ නිෂ්පාදනය හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය | කෘෂි සංවර්ධන/ කෘෂි පර්යේෂණ/ කෘෂි ආර්ථික විද්‍යා | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද නව තනතුරු වේ. |
| 2 | අතිරේක ලේකම්,<br>පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි, බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 3 | අධ්‍යක්ෂ ජනරාල්,<br>වාරිමාර්ග අමාත්‍යාංශය | | |
| 4 | අධ්‍යක්ෂ ජනරාල්,<br>වැවිලි අමාත්‍යාංශය | | |
| 5 | අධ්‍යක්ෂ ජනරාල්,<br>පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 6 | අධ්‍යක්ෂ ජනරාල්,<br>සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 7 | අධ්‍යක්ෂ ජනරාල්,<br>නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 8 | අධ්‍යක්ෂ ජනරාල්,<br>ඉඩම් කළමනාකරණ කටයුතු, රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපළ සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 9 | අධ්‍යක්ෂ ජනරාල්,<br>මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 10 | අධ්‍යක්ෂ ජනරාල්,<br>පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධන හා ආශ්‍රිත කෘෂිකාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන හා විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 11 | අධ්‍යක්ෂ ජනරාල්,<br>ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 12 | අධ්‍යක්ෂ ජනරාල්,<br>විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහු දින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 13 | අධ්‍යක්ෂ ජනරාල්,<br>වනජීවි රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | | |
| 14 | අධ්‍යක්ෂ ජනරාල්,<br>උක්, බඩඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය | | |

03. උසස් කිරීමේ ක්‍රමය :-

3.1 රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සිදු කරනු ලබන සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පරීක්ෂා කිරීමකින් අනතුරුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන නිර්දේශයන් ඉදිරිපත් කරන අතර , ඒ සඳහා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන්ගුණයකට නොවැඩි , පුරප්පාඩුවට නියමිත ධාරාවන්ට අයත් I ශ්‍රේණියේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

3.2 නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨත්වය පදනම් කරගෙන විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සිදු කරනු ලබන අතර , එක් එක් උසස්වීම් දිනට අදාළ ජ්‍යෙෂ්ඨතා ලේඛණය, එම එක් එක් දිනයන්ට උසස්වීමට සුදුසුකම් ලැබූ නිලධාරීන් උසස් වීමට පෙර පැවති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙලින් සැකසේ.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියේ තනතුරු සඳහා උසස්වීම් කරනු ලබන අතර, අයදුම්කරුවන් විසින් මූලික සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ කල යුතුවේ. ඔබ විසින් මේ සමඟ වන ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පතක්, කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් මගින් 2021.05.06 දිනට හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. එදිනට පසුව එවන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලබන අතර, සදොස්ව හා අසම්පූර්ණව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි ,

........................................
එම්.බී. රෝහණ පුෂ්පකුමාර
ලේකම්,
කෘෂිකර්ම අමාත්‍යාංශය

දිනය:- 2021.04.........